# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1992 අංක 4 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1992 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි

# 1992 අංක 4 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 42/89

**ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව සංස්ථාපනය කිරීම සඳහා වූ පනතකි.**

පුරාවිද්‍යාව සහ සමවාර්ගික විෂයයන් අධ්‍යයනය හා ප්‍රගුණ කිරීම සඳහා ද පුරාවිද්‍යා අධ්‍යාපනය සංවිධානය කිරීම හා පාලනය කිරීම සඳහා ද පුරාවිද්‍යා වෘත්තියේ තත්වය සහ අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ද ඒවාට සමාන, ආනුෂංගික හා වැඩදායක වෙනත් පරමාර්ථ සඳහා ද, පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව එකී සභාවට අදාළ සියලු කරුණු කාර්යක්ෂමව කරගෙන යාමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා ද "පුරාවිද්‍යාඥයන්ගේ සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් මෙහි පිහිටුවා ඇති හෙයින් ද : පූර්විකාව.

එම සභාව පිහිටුවන ලද්දේ කවර පරමාර්ථ හා කාර්ය සඳහා ද ඒ පරමාර්ථ හා කාර්ය වඩාත් සාර්ථක ලෙස කරගෙනයාමට සහ ඉටුකිරීමට ඊට හැකිවනු පිණිස සභාව සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලුම ලබාදීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 4 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භවීමේ දින සිට හා ඉන්පසු ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සියලු ආරම්භක සාමාජිකයන් මෙයින් පිහිටුවන ලබන හා සංස්ථාපනය කරනු ලබන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවට එහි සංස්ථාගත සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගත යුතු අතර, (එකී සභාවේ ඔවුන් සංස්ථාගත සාමාජිකයන්ව සිටිනතාක් කල්) එහි සංස්ථාගත සාමාජිකයන් විය යුතුය ; තව ද එම සාමාජිකයන්, (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව" යන නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර සභාවේ එකී නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය. තවද පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි කලින් කල එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය සභාවට ඇත්තේ ය. එසේම, සංස්ථාවට ආනුෂංගික හෝ අදාළ වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීමේ බලය ද එයට ඇත්තේ ය. සභාව සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ උදෙසා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) පුරාවිද්‍යාව සහ අදාළ විෂයයන් ද ඒ හා සම්බන්ධිත කලා සහ විද්‍යාවන් ද පිළිබඳ අධ්‍යයන පරිචය සහ ඒවා යොදා ගැනීම ද ඒ සම්බන්ධ පර්යේෂණ ද ප්‍රවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම ;

(ආ) පුරාවිද්‍යාඥයන් වශයෙන් සුදුසුකම් ලැබීමට කැමති තැනැත්තන් ඇතුළත් කර ගැනීම සහ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව ලබාදීම, සංවිධානය කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම, සභාවේ සාමාජිකත්වය සඳහා සුදුස්සන් වීමේ විභාග සඳහා අධ්‍යයන පාඨමාලා නියම කිරීම හෝ අනුමත කිරීම සහ එවැනි පාඨමාලා සහ විභාග පැවැත්වීම හෝ පැවැත්වීම පිණිස විධිවිධාන ඇති කිරීම ;

(ඇ) සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම් ද සභාවේ සාමාජිකයන් සඳහා වූ වෘත්තීය, චර්යා පිළිබඳ ප්‍රමිති ද නියම කිරීම සහ ඒවා පවත්වාගෙන යාම සහතික කිරීම ;

(ඈ) ශ්‍රී ලංකාවෙහි පුරාවිද්‍යාඥයන්ගේ ස්වාර්ථ සිද්ධි, තත්ත්වය, ශුභ සිද්ධිය, අයිතිවාසිකම් සහ වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම සහ වෘත්තියට කැමති තැනැත්තන්ට අදාළව මහජනයාගේ ස්වාර්ථ සිද්ධි ආරක්ෂා හා වර්ධනය කිරීම ;

(ඉ) තොරතුරු මධ්‍යස්ථානයක්, රසායනාගාරයක්, කෞතුකාගාරයක්, පුස්තකාල සහ වෙනත් එවැනි පුරාවිද්‍යා හා ආශ්‍රිත විෂයයන් පිළිබඳ විශේෂඥ සේවා ඇති කිරීම හා පවත්වාගෙන යාම ;

(ඊ) සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් සඳහා සහ ඔවුන්ගේ යැපෙන්නන් සඳහා විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් සහ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඇති කිරීම හා පවත්වාගෙන යාම සහ ශිෂ්‍ය සමිතිවලට මුදල් හෝ අන්‍යාකාර ආධාර දීම ;

(උ) ඉහත කී පරමාර්ථ ඉටුකරගැනීම හෝ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ඊට ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා ඉටුකිරීම.

සභාවේ බලතල.

4\. සභාවට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :—

(අ) සභාවේ කාර්ය සඳහා යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමේ, දැරීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ හෝ දීමේ, උකස් කිරීමේ, ඔඩපනය කිරීමේ, විකිණීමේ හා හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් නියාදනය කිරීමේ බලය ;

(ආ) සභාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම හෝ බලතල ක්‍රියාත්මක කිරීම හෝ සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට සෘජුවම හෝ සභාව විසින් තත්කාර්ය සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ එළඹීමේ, ඒවා ඉටු කිරීමේ හෝ කරගෙනයාමේ බලය ;

(ඈ) යම් බැංකුවක හෝ බැංකුවල ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ හා ජංගම, තැන්පතු හා ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාමේ බලය ;

(ඇ) සභාවේ කාර්ය සඳහා සභාව විසින් සුදුසු යයි කල්පනා කරන යම් ඇපයක් මත මුදල් අත්තිකාරම් දීමේ හෝ ණයට ගැනීමේ බලය ;

(ඉ) සාමාජිකත්වය සම්බන්ධයෙන් ද සාමාජිකත්වයට ඇතුළත් කරගැනීම සහ සභාව විසින් පවත්වනු ලබන පාඨමාලා වලට හා විභාගවලට ඇතුළත් කරගැනීම සම්බන්ධයෙන් ද ගාස්තු, දායක මුදල් සහ සාමාජික මුදල් අයකිරීමේ බලය ;

(ඊ) පුරාවිද්‍යාඥයන් ලෙස සුදුසුකම් ලැබීමට කැමති තැනැත්තන් පුහුණුකිරීම, පිළිබඳ නියමයන් සහ කොන්දේසි නියම කිරීමේ බලය සහ පුහුණු කිරීමේ, අධීක්ෂණය කිරීමේ, පාලනය කිරීමේ හා විධිමත් කිරීමේ බලය ;

(උ) නිලධරයන් හා සේවකයන් පත්කිරීමේ, සේවයෙහි නියුක්ත කිරීමේ, මාරුකිරීමේ, සේවයෙන් පහකිරීමේ හා ඔවුනට විරුද්ධව වෙනත් විනයානුකූල කටයුතු කිරීමේ බලය සහ ඔවුන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කිරීමේ බලය ;

(ඌ) සාමාන්‍යයෙන් සභාවේ පරමාර්ථ ඉටුකර ගැනීම හෝ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ඊට ආනුෂංගික හෝ හිතකරවූ ද මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතිය කට අනනුකූල නොවන්නා වූ ද එවැනි සියලු ක්‍රියා කිරීමේ බලය.

5.(1) සභාවේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම (මෙහි මින්මතු 'මණ්ඩලය' යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, ඒ මණ්ඩලය විසින් මේ පනතින් සභාව වෙත පවරන ලද හෝ පන වන ලද හෝ වෙන්කර දෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කළ යුතු ය. පාලක මණ්ඩලය.

(2) (අ) සභාව, මේ පනතේ සහ මේ පනත යටතේ සාදන ලද රීතිවල විධිවිධානවලට අනුකූලව තෝරා පත්කර ගත් හෝ පත්කරන ලද සාමාජිකයන් දහනව දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(ආ) සභාවේ සංස්ථාගත නොවන සාමාජිකයන් හෝ ඒ සාමාජිකයන්ගේ යම් පන්තියක් නියෝජනය කිරීම සඳහා සංස්ථාගත නොවන සාමාජිකයන් අතුරින් තැනැත්තන් තුන් දෙනෙකුට වැඩි නොවන ගණනක් මණ්ඩලයේ සාමාජිකයන් ලෙස, රීති මගින් තෝරාපත් කර ගැනීමට හෝ පත්කර ගැනීමට මණ්ඩලයට හැකි අතර, ඒ සාමාජිකයන්ට එවැනි රීති මගින් නියම කරනු ලැබිය හැකි අයිතිවාසිකම් සහ වරප්‍රසාද තිබිය යුත්තේ ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද පළමුවන මණ්ඩලය, මේ පනත ආරම්භ වන දිනයේ දී ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලන මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) සභාවේ හෝ මණ්ඩලයේ කවර වූ හෝ ක්‍රියාවක් හෝ කටයුත්තක් මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයකුගේ තෝරා පත් කිරීම හෝ පත් කිරීම සම්බන්ධයෙන් වූ යම් දෝෂයක් හෝ පැවතීම හේතුකොට ගෙන නිර්බල නොවිය යුතු ය; නැතහොත් එසේ නිර්බල වූ සේ නොසැලකිය යුතු ය.

රීති සෑදීමට ඇති බලය.

6. (1) මේ පනතේ මූලධර්ම හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ ඒවා බලාත්මක කිරීම සඳහා ද නියම කළ යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියම කරනු ලැබ ඇති යම් කාරණයක් පිළිබඳව ද, මණ්ඩලය විසින්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ රීති සාදනු ලැබිය හැකි අතර, එවැනි යම් රීතියක් කලින් කල සංශෝධනය කිරීම, ඊට එකතු කිරීම, ප්‍රතියෝජනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) ඉහතින් වූ උපවගන්තියේ විධිවිධානවලින් සපයනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, මණ්ඩලය විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකිය :—

(i) මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය, සභාවට තෝරා පත් කර ගැනීම සඳහා සුදුසුකම් හා එය කළ යුතු ආකාරය, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය අත්හැර යාම සහ සාමාජිකයන්ගේ අනියම් පුරප්පාඩු පිරවීම, මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය පැවරීම සහ කමිටු සහ මණ්ඩල පත් කිරීම, මණ්ඩලයේ වාර්ෂික වාර්තාව, මණ්ඩලයේ සභාපතිවරයා තෝරා පත් කරගැනීම සහ ධුර කාලය හා ධුරය අත්හැර යාම ;

(ii) මණ්ඩලයේ නිලධරයන්ගේ අධිනිවාසිකම්, බලතල කර්තව්‍ය හා කාර්යයන් ;

(iii) මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම, වාර්ෂික මහා සභා රැස්වීම, සභාවේ සාමාජිකයන්ගේ වෙනත් මහා සභා රැස්වීම් සහ විශේෂ මහා සභා රැස්වීම්, එකී රැස්වීම් පිළිබඳ දැන්වීම්, ඒවායේ න්‍යාය පත්‍ර, ඒවායේ ගණපූරණය සහ ඒවායේ කටයුතු කරගෙන යාම ;

(iv) සභාවේ දේපළ කළමනාකරණය කිරීම හා එහි අරමුදල් භාරව කටයුතු කිරීම ;

(v) වෘත්තීය ආචාරධර්ම රීති සංග්‍රහයක් සකස් කිරීම ;

(vi) පැමිණිලිවල ආකාරය, විනය කමිටු පත් කිරීම හා ඒවාට නීති සහාය ලබාදීම පිණිස විධිවිධාන ඇති කිරීම, චෝදනා පිළියෙල කිරීම, ඒවාට පිළිතුරු වශයෙන් නිදහසට කරුණු ඉදිරිපත් කිරීම, දැන්වීම් නිකුත් කිරීම, නීතිඥයන් මගින් කරුණු කියා සිටීමට පාර්ශ්වකරුවන් සතු අයිතිවාසිකම්, එහිලා අදාළ වන සාක්ෂි පිළිබඳ නීති, පරීක්ෂණ කටයුතුවල වාර්තා තබා ගැනීම සහ විනය කමිටුවල වාර්තාවල ආකෘතිය හා ඒවායේ අඩංගු කළ යුතු කරුණු ඇතුළුව විනයානුකූල පරීක්ෂණ පිළිබඳව වූ කාර්ය පරිපාටිය ;

(vii) ගරු සාමාජිකයන් තෝරා පත්කර ගැනීම.

(3) එවැනි රීති හෝ ඒවායේ සංශෝධන, එකතු කිරීම්, ප්‍රතියෝනය කිරීම් හෝ ඒවායේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම්, තත් කාලයේ බලාත්මකව පවතින රීතිවල විධිවිධානවලට අනුකූලව පවත්වනු ලබන, සභාවේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සංස්ථාගත සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතරයකින් අනුමත කළහොත් මිස වලංගු නොවිය යුතු අතර, ඒවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මකව පැවැති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සමග ඒවා අනනුකූල නොවන තාක් දුරට, මණ්ඩලය විසින් මේ වගන්තිය යටතේ සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව සංශෝධනය කිරීම හෝ එකතු කිරීම කරනු ලැබිය හැකි ය.

සභාවේ සාමාජිකත්වය.

**7.** (1) සභාවේ සංස්ථාගත සාමාජිකත්වය අධි සාමාජිකයන්ගෙන්, සාමාජිකයන්ගෙන් සහ ආශ්‍රිත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:

එසේ වුවද, මණ්ඩලය විසින්, සභාවේ සංස්ථාගත සාමාජිකත්වය සඳහා සුදුසුකම් නොමැති තැනැත්තන් (එවැනි කණ්ඩායම්වල ඡන්දය දීමට අයිතියක් නැති සහ නියම කරනු ලැබ ඇති අයිතිවාසිකම්, වරප්‍රසාද සහ බැඳීම් සමග) සංස්ථාගත නොවන සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලැබිය හැකි ය.

(2) සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්, සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීමේ ආකාරය හා ඇතුළත් කර ගැනීම, සාමාජිකත්ව සහතිකවල ආකෘතිය සහ ඒවා නිකුත් කිරීම, සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාම, ඇතුළත්වීමේ ගාස්තු, දායක මුදල් හා සාමාජික මුදල් සහ වෘත්තීයෙහි යෙදෙන සාමාජිකයන් විසින් ගෙවිය යුතු යම් අතිරේක ගාස්තු ප්‍රමාණ සහ ගෙවීමේ ආකාරය, ඒවා අත්හැරීම සහ ඒවා නොගෙවීමේ ප්‍රතිඵල, සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද හා කාර්යයන් සහ ඉල්ලා අස්වීම හා නැවත ඇතුළත්වීම ඇතුළුව සාමාජිකත්වයේ කොන්දේසි සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් වුවද මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ශ්‍රී ලංකා පුරා විද්‍යාඥයන්ගේ සභාවේ සාමාජිකයන් වූ සියලු තැනැත්තන්, සභාවේ සාමාජිකයන් විය යුතු අතර, සියලු කාර්ය සඳහා සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද මේ පනතේ සහ මේ පනත යටතේ සාදන ලද රීතිවල විධිවිධානවලට යටත්ව, ඒ තත්ත්වයෙන් දිගටම සිටිය යුතු ය.

සාමාජිකත්වය සඳහා නුසුදුසුකම් සහ විනයානුකූල බලතල හා කාර්ය පටිපාටිය.

8. (1) යම් තැනැත්තකු—

(අ) ශ්‍රී ලංකාවේ හෝ අන් රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල් තැනැත්තකු යයි නිශ්චය කරනු ලැබ සිටී නම්; හෝ

(ආ) බුන්වත් තැනැත්තකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වශයෙන් ශ්‍රී ලංකාවෙහි හෝ අන් රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් නිශ්චය කරනු ලැබ, ඔහුගේ බුන්වත්භාවය හෝ වස්තු භංගත්වය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් නොවැලැක්විය හැකි පාඩු විඳීම් හෝ අවාසනාවන්ත සිද්ධීන් නිසා උද්ගත වී ඇති බවට සහතිකයක් ඒ අධිකරණය විසින් ප්‍රදානය කර නොමැතිව සිටී නම්; හෝ

(ඇ) නියමිත වරදක් සම්බන්ධයෙන් හෝ චරිත දූෂණාත්මක වරදක්වන්නා වූ ද බන්ධනාගාරගත කිරීමෙන් හෝ සමාන දඬුවමකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වූ ද වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි හෝ අන් රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ සිටී නම් සහ නිදහස් සමාවක් දෙනු ලැබ නොමැති නම්

ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් ඇතුළත් කරගනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නුසුදුසුකම්වලින් යම් නුසුදුසුකමකට යටත් වන යම් සාමාජිකයකු මණ්ඩලය විසින් සාමාජික නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද ඒ තැනැත්තා ඒ නුසුදුසුකමට යටත්ව සිටීම අවසන් කළහොත් හෝ එකී තැනැත්තා ස්වකීය චරිතය හැඩගස්වා ගෙන සිටින බවද පුරාවිද්‍යාඥයන්ගේ වෘත්තියෙහි යෙදීමට සුදුසුව සිටින බවද මණ්ඩලයේ මතය වේ නම්, මණ්ඩලය විසින් එකී අභිමතය අනුව ඔහු නැවත ඇතුළත් කර ගනු ලැබිය හැකි ය.

(3) වෘත්තීය විෂමාචාරය සම්බන්ධයෙන් වරදක් කර ඇතැයි මණ්ඩලයේ මතය වන යම් සාමාජිකයකු මණ්ඩලය විසින් සාමාජික නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද මණ්ඩලය විසින්, සාමාජික නාමලේඛනයෙන් ඔහුගේ නම ඉවත් කිරීම වෙනුවට එකී සාමාජිකයාට තදින් අවවාද කිරීම හෝ සියලුම අවස්ථාගත කරුණු අනුව මණ්ඩලය විසින් යුක්ති සහගත යයි හා සාධාරණ යයි සලකන එක් අවුරුද්දක් නොඉක්මවන යම් කාලයක් සඳහා ඔහුගේ සාමාජිකත්වය අත්හිටුවීම කළ හැකිය ; එසේම තවදුරටත් එකී තැනැත්තා ස්වකීය චරිතය හැඩ ගස්වා ගෙන සිටින්නේ යයිද පුරාවිද්‍යාඥයන්ගේ වෘත්තියෙහි යෙදීමට සුදුසු යයිද සභාවේ මතය වේ නම්, මණ්ඩලය විසින් තම අභිමතය අනුව, ඔහු නැවත ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලය විසින් පත් කරන ලද විනය කමිටුවක් විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු ඉහත කී නුසුදුසුකම්වලින් යම් සාමාජිකයකු යටත්ව සිටින බවට හෝ වෘත්තීය විෂමාචාරය සම්බන්ධයෙන් වරදක් කර ඇති බවට හෝ මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇත්නම් මිස, මණ්ඩලය විසින් මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන යටතේ කිසිදු සාමාජිකයකු සාමාජික නාමලේඛනයෙන් ඉවත් කිරීම, සාමාජිකත්වයෙන් අත්හිටුවීම හෝ කිසිම සාමාජිකයකුට තදින් අවවාද කිරීම හෝ නොකළ යුතු ය.

(5) (අ) යම් තැනැත්තකුගේ සාක්ෂිය හෝ යම් තැනැත්තකු හෝ යම් තැනැත්තකුට හෝ සංවිධානයකට අදාළ වූ යම් ලේඛනයක් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කිරීම එවැනි පරීක්ෂණයකට අදාළ යයි හෝ අවශ්‍ය යයි මණ්ඩලය විසින් පත් කරන ලද විනය කමිටුවක මතය වන අවස්ථාවක සාක්ෂි දීමට හෝ ඒ ලියවිල්ල ඉදිරිපත් කිරීමට, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති වේලාවේ දී හා ස්ථානයට පැමිණෙන ලෙස ඒ තැනැත්තාට නියම කිරීමට ඊට බලය ඇත්තේ ය.

(ආ) මණ්ඩලය විසින් පත් කරන ලද විනය කමිටුවකට, ඒ කමිටුව හමුවේ සාක්ෂිදීමට නියම කරනු ලබන සියලු තැනැත්තන් දිවුරවීමෙහි හා ප්‍රතිඥා ලබා ගැනීමෙහි බලය ඇති අතර, දිවුරුම් පිට හෝ ප්‍රතිඥා දීම පිට ඕනෑකමින්ම බොරු සාක්ෂි දෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(ඇ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබ සිටින යම් තැනැත්තකු සාධාරණ හේතුවක් නොමැතිව පැමිණ නොසිටියහොත් හෝ පැමිණීම හෝ යම් ප්‍රශ්නයකට උත්තරදීම හෝ ඒ දැන්වීමේ සඳහන් කර ඇති යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම ප්‍රතික්ෂේප කළහොත්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය :

එසේ වුවද, ඒ තැනැත්තා සාක්ෂි ආඥා පනත ද ඇතුළුව, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ එහි විධිවිධාන ප්‍රකාර පැමිණ සිටීමෙන් හෝ සාක්ෂි දීමෙන් හෝ එවැනි ප්‍රශ්නවලට උත්තරදීමෙන් හෝ ඒ ලේඛන ප්‍රතිෂ්ඨ දීමෙන් නැතහොත් දිවුරුම් දීමෙන් හෝ සහතික කරනු ලැබීමෙන් වැළකී සිටීමට නියම කරනු ලැබ ඇති හෝ අවසර දෙනු ලැබ ඇති අවස්ථාවක, පැමිණ සිටීමට හෝ සාක්ෂි දීමට හෝ යම් ප්‍රශ්නයකට උත්තරදීමට හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ දිවුරුම් දීමට නැතහොත් ප්‍රතිඥා දීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම වරදක් නොවන්නේ ය.

(6) (අ) (3) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ තීරණයෙන් අතෘප්තියට පත් කවර හෝ තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව, ඒ තීරණය ඔහු වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දවස් දහහතරක් ඇතුළත, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් කළ හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ යම් අභියාචනයක් කරනු ලැබූ විට, ලේකම්වරයා විසින්—

(1) එම අභියාචනයට ඉඩ දී—

(i) ඒ සාමාජිකයාගේ නම ලේඛනයෙහි නැවත ඇතුළත් කරන ලෙසත් ; නැතහොත්

(ii) එම සාමාජිකයා වෙත පනවන ලද සාමාජිකත්වය අත්හිටවීම, අවලංගු කරන ලෙස

මණ්ඩලයට විධාන කළ හැකිය ;

(2) එම අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකි ය.

(7) (අ) අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට ලේකම්වරයා ගත් තීරණයෙන් අතෘප්තියට පත් යම් සාමාජිකයකු විසින් ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(ආ) මේ වගන්තිය යටතේ වූ අභියාචනාවලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, ප්‍රතිශෝධන මාර්ගයෙන් වූ ඉල්ලීම්වලට අදාළව අභියාචනාධිකරණයට කෙරෙන අභියාචන සම්බන්ධයෙන් ඒ ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබ ඇති රීති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (අ) ඡේදය යටතේ වූ අභියාචනාවලට අදාළ විය යුතු ය.

9. (අ) වෘත්තීය ක්‍රියා කලාපය පිළිබඳ රීති සංග්‍රහයක් සඳහා විධිවිධාන සැලසෙන රීති සෑදීමට සහ ඒ රීති සංග්‍රහය සංශෝධනය කිරීමට, ඊට එකතු කිරීමට ප්‍රතියෝජනය කිරීමට හෝ අවලංගු කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය. වෘත්තීය සහ ක්‍රියාකලාපය පිළිබඳ රීති සංග්‍රහය.

(ආ) මේ පනත ආරම්භ වූ දිනයේ සිට මාස හයක කාලයක් තුළ දී වෘත්තීය ක්‍රියා කලාපය පිළිබඳ රීති සංග්‍රහයක් මණ්ඩලය විසින් රීති මගින් නියම කරනු ලැබිය යුතු ය. 6(3) වගන්තියේ විධිවිධාන ඊට අදාළ නොවිය යුතු ය. එවැනි රීති සංග්‍රහයන් එය ගැසට් පත්‍රයේ පළ කරන දිනයේදී හෝ එහි නියම කරනු ලබන වෙනත් පසු දිනයක දී ක්‍රියාත්මක වීම සිදුවිය යුතු ය.

10. මණ්ඩලය විසින් පරිපාලන නිලධරයකු සහ එහි බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යයි මණ්ඩලයට හැඟෙන පරිදි වෙනත් නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි ය. සභාවේ නිලධරයන් හා සේවකයන්.

11. (1) ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ සභාවේ වෙනත් ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය. විගණනය හා ගිණුම්.

(2) විගණකාධිපතිවරයා විසින් සභාවේ ගිණුම් සෑම වර්ෂයකම විගණනය කළ යුතු ය. ඒ ගිණුම් විගණනයේ දී තමාට සහායවීම පිණිස, තමාගේ අභිමතය හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු සුදුසුකම් ලත් විගණකවරයකු විගණකාධිපතිවරයා විසින් සේවයෙහි යොදවා ගනු ලැබිය හැකි ය.

(3) සභාවේ ගිණුම් විගණනය කිරීම පිළිබඳව විගණකාධිපතිවරයා විසින් දරන්නට සිදුවන වියදම් පියවා ගැනීමේ කාර්ය සඳහා, මණ්ඩලය විසින් නිගමනය කරනු ලබන පරිදි, සභාවේ ආදායමින් විගණකාධිපතිවරයාට ලැබෙන යම් පාරිශ්‍රමිකයකින්, ඒ විගණනය පැවැත්වීමේ කාර්ය සඳහා ඔහු විසින් සේවයේ නියුක්ත කරන ලද යම් සුදුසුකම් ලත් විගණකවරයකුට හෝ විගණකවරයන්ට ඔහු විසින් ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(4) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වන දවසට පසුව හැකිතරම් ඉක්මණින්, විගණකාධිපතිවරයා විසින් එම වර්ෂය තුළ සභාවේ කටයුතු පරිපාලනය පිළිබඳ වාර්තාවක් සහ සභාවේ ආදායම හා වියදම් පිළිබඳව සහ එම වර්ෂය තුළ දී සභාවට අයිති මුදල් ආයෝජනය කිරීම පිළිබඳව ප්‍රකාශයක් පිළියෙල කළ යුතු ය.

(5) මේ වගන්තියේ " සුදුසුකම් ලත් විගණකවරයා " යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ සාමාජිකයකු හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද ඒ ආයතනයේ සභාව

විසින්, ගණකාධිකාරිවරයකු ලෙස වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද පුද්ගලයකු ; හෝ

(ආ) එක් එක් නේවාසික හවුල්කරුවකු, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ සාමාජිකයකු හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද ඒ ආයතනයේ සභාව විසින් ගණකාධිකාරිවරයකු ලෙස වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තන් වූ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ව්‍යාපාර ආයතනයක් අදහස් වේ.

විගණකාධිපතිවරයාගේ ප්‍රකාශය හා වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව.

12. 11 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පිළියෙල කරන ලද වාර්තාව, ඔහු විසින් සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර, ඒ අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව පාර්ලිමේන්තුව හමුවෙහි තැබිය යුතු ය.

අභිධාන පාවිච්චි කිරීම.

13. (1) සභාවේ සෑම සංස්ථාගත සාමාජිකයකුටම "පුරාවිද්‍යාඥයා" යන අභිධානය ගැනීමට හා පාවිච්චි කිරීමට හිමිකම ඇත්තේය. අධි සාමාජිකයකුට ස්වකීය නමට පසුව "එෆ්. එස්. එල්. සී. ඒ." යන මුලකුරු ද ආශ්‍රිත සාමාජිකයකුට "එම්. එස්. එල්. සී. ඒ." යන මුලකුරු ද ආශ්‍රිත සාමාජිකයකුට "ඒ. එස්. එල්. සී. ඒ." යන මුලකුරු ද පාවිච්චි කිරීමට හිමිකම ඇත්තේය.

(2) ඉහත කී ලෙස හැර, යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් මණ්ඩලයක් විසින් "පුරාවිද්‍යාඥයා" යන අභිධානය හෝ "එෆ්. එස්. එල්. සී. ඒ.". "එම්. එස්. එල්. සී. ඒ." හෝ "ඒ. එස්. එල්. සී. ඒ." යන මුලකුරු ගැනීම හෝ පාවිච්චි කිරීමද යම් පොතක, සඟරාවක හෝ වෙනත් පළකිරීමක නම හෝ නමේ කොටසක් ලෙස එය පාවිච්චි කිරීම නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

දණ්ඩනය.

14. (1) මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන යම් තැනැත්තකු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

(2) මණ්ඩලය විසින් හෝ තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකු හෝ නිලධරයකු විසින් හැර වෙනත් තැනැත්තකු විසින් මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.

15. (අ) සභාවේ පොදු මුද්‍රාව, සභාව විසින් යෝජනා සම්මතයක් මගින් නිගමනය කරනු ලබන පරිදි වූ හැඩයෙන්, ප්‍රමාණයෙන් හා සැලැස්මෙන් යුක්ත විය යුතු ය. පොදු මුද්‍රාව.

(ආ) මුද්‍රාවේ ආරක්ෂා සහිත භාරකාරත්වය පිළිබඳව මණ්ඩලය වගකිව යුතු ය. මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් මගින් කලින් කල බලය දෙනු ලබන මණ්ඩලයේ නිලධරයන් දෙදෙනකු ඉදිරිපිට දී ඔප්පුවලට හා ලේඛනවලට මුද්‍රාවතැබිය යුතු අතර, ඒ නිලධරයන් විසින් එසේ තැබීම සහතික කළ යුතු ය.

16. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නාවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.